මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

நிதி, பொருளாதார மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு

MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය

தேசிய கொள்கை மற்றும் பொருளாதார விவகாரங்கள் பிரிவு

National Policy and Economic Affairs Division

2019

කාර්යසාධන වාර්තාව

செயற்திறன் அறிக்கை

Performance Report

කාර්යසාධන වාර්තාව
செயற்திறன் அறிக்கை
Performance Report

2019

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
நிதி, பொருளாதார மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMY AND POLICY DEVELOPMENT

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය
தேசிய கொள்கை மற்றும் பொருளாதார விவகாரங்கள் பிரிவு
National Policy and Economic Affairs Division

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය

වැය ශීර්ෂ අංකය 104

අන්තර්ගතය

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය V

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 7

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 21

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක 29

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 31

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ 33

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව 37

ඇමුණුම 01 - විගණන වාර්තාව

මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ පණිවිඩය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය සහ මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මගින් 2019 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය ඇතුලත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම සතුටට කරුණකි.

“සෞභාගයේ දැක්ම” ප්‍රතිපත්ති ප්‍රකාශනය මගින් ග්‍රාමීය සංවර්ධනය තුළින් කලාපීය විෂමතා අවම කිරීම සහ ජනතාව කේන්ද්‍රීය ආර්ථිකයක් ඇති කිරීම තුළින් රට සංවර්ධනය කිරීමට අපේක්ෂා කර ඇත. ජාතික ප්‍රතිපත්ති තුළින් අන්තර් ආර්ථික වර්ධනය හා සමෘද්ධිය ළඟා කර ගැනීමේ දැක්ම ඇතිව, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ ගතික ආර්ථික උපාය මාර්ග තුළින් සෑම පුරවැසියෙකුගේම සංවර්ධනයේ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා රාජ්‍ය අමාත්‍යාංශය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, සියළුම පුරවැසියන්ට ඉහළ ආදායමක් සහ වඩා හොඳ ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට අවස්ථාව ලැබෙන පරිසරයක් නිර්මාණය කිරීමට පියවර ගෙන තිබේ.

මෙම මඟ පෙන්වීම යටතේ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මෙම වසර අගදී මුළු රටම ආවරණය වන පරිදි “සපිරි ගමක්” - මහජන සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන දියත් කර ඇති අතර ග්‍රාමීය හා කලාපීය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය ඉටු කර ඇත.

ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කටයුතු සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය සහ ඵලදායී මග පෙන්වීම ලබා දුන් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරයා වන ගරු අග්‍රාමාත්‍යතුමාට සහ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා වෙත නිහතමානීව කෘතඥතාව පළ කිරීම සඳහා මෙය අවස්ථාවක් කර ගනිමි. අවසාන වශයෙන්, අමාත්‍යාංශයේ කාර්යසාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා පූර්ණ සහයෝගය ලබා දුන් රාජ්‍ය අමාත්‍යාංශයේ සහ ඒ යටතේ ඇති සියලුම ආයතනවල නිලධාරීන්ට මම ස්තූතිවන්ත වෙමි.

එස්. ආර්. ආටිගල
ලේකම්
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

01 පරිච්ඡේදය- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙනුවට 2018.12.28 දිනැති අංක 2103/33 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයට අනුව ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශය පිහිටුවන ලදී. 2019.03.18 දිනැති අංක 2115/09 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් එම අමාත්‍යාංශය ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, සහ යෞවන කටයුතු අමාත්‍යාංශය ලෙස සංශෝධනය කර ඇත. ඒ අනුව, අමාත්‍යාංශයට අදාල ආයතනයන් හා කාර්යභාරයන් ද නැවත සංශෝධනය කර ඇත. විශාල ජාතික කාර්යභාරයක් පැවරී ඇති පෙර කී අමාත්‍යාංශය තුල 2019 වර්ශයේදී වැය ශීර්ෂ 104 යටතේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය ක්‍රියාත්මක විය.

2019 නොවැම්බර් මස 16 වන දින පැවති ජනාධිපතිවරණයෙන් පසුව නව රජයක් පිහිටුවනු ලැබූ අතර 2153/12 අංක දරණ 10.12.2019 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශයන්ගේ විෂයපථය වෙනස් විය. ඒ අනුව පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ කාර්යයන් මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතට පැමිණි අතර 2019 වර්ෂය අගභාගයේ දී වැය ශීර්ෂ 104 යටතේ ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ යටතේ අමාතයාංශයේ කටයුතු සිදු කෙරිනි.

ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ලබන අතර. ජනතාවගේ ආදායම් මට්ටම වැඩිකිරීමේ අභිලාෂයෙන් යුතුව අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය පියවර සැලසුම් කරනු ලැබේ. තවද, රටේ ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කර ඇත. සංවර්ධනයේදී ප්‍රාදේශීය සමබරතාවය තහවුරු කර ගැනීමට හා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබේ. රජයේ ප්‍රතිපත්තිමය නියමයන්ගේ මඟපෙන්වීම යටතේ යහපාලන මූලධර්ම සමඟ අනුගතව සමාජ සුභසාධනය, දිගු කාලීන සෞභාග්‍යය සහ තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා මෙම පියවර ඉලක්ක ගතකර ඇත.

ඒ අනුව, පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ හා ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ මගින් 2019 වර්ෂයේ සිදුකල කාර්යයන්ට අදාළ කාර්යය සාධනයට අදාළ තොරතුරු පහත දැක්වේ.

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

තිරසර ජාතික ප්‍රතිපත්තින් තුළින් සාර්ව සහභාගිත්ව ආර්ථික වර්ධනය සහ සෞභාග්‍යය

මෙහෙවර

සාර්ව සහභාගිත්ව ආර්ථික වර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තීන් සහ ගතික ආර්ථික ක්‍රමෝපායයන් සම්පාදනය හරහා සෑම පුරවැසියෙකු උදෙසාම සංවර්ධනයේ ප්‍රතිලාභ සහතික කිරීම

අරමුණු

- ආර්ථික සංවර්ධනය අත්පත් කරගැනීම
- දිළිදුකම පිටුදැකීම
- රැකියා වියුක්තිය පිටුදැකීම හා ඌන රැකියා නියුක්තිය අවම කිරීම
- දේශීය ඉතුරුම් ප්‍රවර්ධන මඟින් ආයෝජන ප්‍රවර්ධන
- ආර්ථික හා සමාජයීය යටිතල පහසුකම් ප්‍රවර්ධනය

1.3. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ ප්‍රධාන කාර්යයන්

- ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු යන විෂයයන්ට අදාළව හා මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත්වන දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවලට අයත්වන විෂයයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා වැඩසටහන් සම්පාදනය කිරීම, අධීක්ෂණය හා ඇගයීමේ කටයුතු සිදුකිරීම
- ජාතික සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම
- ආර්ථික සංවර්ධනයෙහිලා පුද්ගලික අංශයේ සහභාගිත්වයට පහසුකම් සැලසීම සඳහා රාජ්‍ය හා පුද්ගලික අංශය අතර සම්බන්ධීකරණ කටයුතුසිදුකිරීම
- අදාළ ජාතික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන අධිකාරීන් සමඟ එකඟවූ කාලරාමු තුළ හා අයැවය ගත සම්පත් සීමාවන් තුළ ඉහත සඳහන් කළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- ප්‍රශස්ත සම්පත් කළමනාකරණයකින් යුක්තව රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක වන බව තහවුරු

කරගැනීම සඳහා නූතන කළමනාකරණ ශිල්ප ක්‍රම යොදාගනිමින් උචිත ක්‍රමෝපාය සැකසීම

- ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ද ඇතුළු දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ආදායම් විෂමතාවය අවම කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් වන ආයතන අධීක්ෂණය කිරීම

1.4. සංවිධාන සටහන



1.5. අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රධාන අංශ

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ කාර්යයන් මනාව සිදු කිරීම සඳහා එය පහත සඳහන් පරිදි උප අංශ හතකට වෙන් කර ඇත.

- පරිපාලන
- සැලසුම්
- ආර්ථික කටයුතු
- සංවර්ධන හා ව්‍යාපෘති
- අභ්‍යන්තර විගණන
- මූල්‍ය
- ප්‍රාදේශීය සංවර්ධන

මීට අමතරව, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව හා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව ද ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ විෂය පථය යටතට ගැනේ.

1.5.1. පරිපාලන අංශය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ පාලන අංශය විසින් අමාත්‍යාංශයේ සියලු අභ්‍යන්තර පරිපාලන කටයුතු හා සමස්ත කාර්ය මණ්ඩලයේ ආයතනික කටයුතු සිදු කරනු ලැබේ. මෙම අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන ආයතනවල පරිපාලන කටයුතු ආශ්‍රිත සියලු ගැටලු සම්බන්ධීකරණයද මෙම අංශය විසින් සිදු කෙරේ.

- අමාත්‍යාංශයේ සියලු අභ්‍යන්තර පරිපාලන කටයුතු සහ එහි කාර්ය මණ්ඩලයේ සියලු ආයතනික හා පරිපාලන කටයුතු
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවලට අදාළ පරිපාලන හා ආයතනික කටයුතු සම්බන්ධීකරණය
- පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සහ උපදේශක කාරක සභාව, මහජන පෙත්සම් කාරක සභාව, රාජ්‍ය ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධ කටයුතු
- අමාත්‍යාංශයේ සියලු ප්‍රසම්පාදන කටයුතු

1.5.2. සැලසුම් අංශය

ඵලදායි හා සංගත ජාතික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති රට වෙනුවෙන් සකස් කිරීමේ කාර්යය සඳහා සම්බන්ධීකරණය හා පහසුකම් සැපයීම සැලසුම් අංශයට පැවරී තිබේ.

- විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටන (DCB) , ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන, ගම්පෙරළිය වැඩසටහන හා ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කිරීම, ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා නිර්දේශ ලබාදීම, ක්‍රියාත්මක කිරීමේ කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය කිරීම හා ප්‍රගති සමාලෝචන කටයුතු
- "සපිරි ගමක්" ජනතා සහභාගීත්ව ප්‍රාදේශිය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- ජාතික මට්ටමේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ/ අමාත්‍ය මණ්ඩල නිරීක්ෂණ සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කටයුතු
- අමාත්‍යාංශයේ කාර්යසාධන වාර්තා, ප්‍රගති වාර්තා, වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
- අමාත්‍යාංශ විෂය පථය යටතේ වන ආයතන සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ කාර්යයන් සම්බන්ධීකරණයයන කාර්යවලදී මෙම අංශය ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු ලැබේ.

1.5.3. ආර්ථික කටයුතු අංශය

ආර්ථික කටයුතු අංශයේ ප්‍රධාන වගකීම් වනුයේ; අමාත්‍යාංශයේ කාර්ය සැලසුමේ සඳහන් පරිදි ප්‍රතිඵල අත්පත් කරගැනීම තහවුරු කරගැනීම සඳහා රජයේ සියලුම ආර්ථික ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති අධීක්ෂණය කිරීම. ජාතික ආර්ථික ප්‍රතිපත්ති හා ක්‍රමෝපාය සැකසීමේ කටයුතු සම්පාදනය හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම, රාජ්‍ය හා පුද්ගලික ආයතන/ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීමේ වගකීම, රක්ෂණ කර්මාන්තය හා ආශ්‍රිත නීති සඳහා පහසුකම් සැපයීම වේ.

තවද, මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ කාර්යයන් සම්බන්ධීකරණය යන කාර්යවලදී මෙම අංශය ප්‍රමුඛ කාර්යයක් ඉටු කරනු ලැබේ.

1.5.4. සංවර්ධන හා ව්‍යාපෘති අංශය

ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයේ සංවර්ධන හා ව්‍යාපෘති අංශයේ ප්‍රධාන කාර්යයන් වනුයේ වැඩසටහන් සම්පාදනය කිරීම, විවිධ ආයතන මඟින් ක්‍රියාත්මක කරන බහු ආංශික ව්‍යාපෘති සම්බන්ධීකරණය හා ආධාර සපයන නියෝජිතායතන සම්බන්ධිකරණය කිරීම වේ. එසේම, වැඩසටහන්වල ප්‍රගති සමාලෝචන, අධීක්ෂණ හා ඇගයීම් කාර්යයන් මෙම සංවර්ධන හා ව්‍යාපෘති අංශයේ විසින් සිදු කරන අනෙකුත් කාර්යයන් වේ.

මීට අමතරව, අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ එක්සත් ජනපද ආයතනය (USAID), ලෝක ආහාර වැඩසටහන (WFP), ලෝක බැංකුව, යුරෝපා සංගමය හා ආසියානු සංවර්ධන බැංකුව වැනි ආයතන විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘතින්හි ඉලක්ක හා අරමුණු අත්පත් කරගැනිම සඳහා සඳහා අවශ්‍ය කෙරෙන සම්බන්ධීකරණය මෙම අංශය විසින් සපයනු ලැබේ

1.5.5. අභ්‍යන්තර විගණන අංශය

- වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමය සැලැස්ම අතින් මෙන්ම සත්‍ය ක්‍රියාකාරිත්වය අතින් සාර්ථකදැයි සොයා බැලීම.

- ගිණුම් සහ වෙනත් වාර්තාවල නිවැරදිභාවය හා විශ්වාසනීයභාවය තීරණය කිරීම සඳහා යොදා ගෙන ඇති ගිණුම්කරණ පිළිවෙත මඟින් නිවැරදි හා මූල්‍ය ප්‍රකාශනයන් පිලියෙළ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයේ දැයි සොයා බැලීම.

- කාර්ය මණ්ඩලයට පවරා දී ඇති වගකීම් ඉටු කිරීමේදී ඔවුන්ගේ කාර්ය සාධනයෙහි ගුණාත්මකතාවය ඇගයීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශයට අයත් ආයතන සතුව පවතින වත්කම්වල ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලසා සියළුම ආකාරයේ අලාභහානි වලින් ආරක්ෂා කර ඇත්ද යන්න සොයා බැලීම.

- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි, රාජ්‍ය පරිපාලන විෂයයභාර අමාත්‍යාංශය සහ භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන උපදෙස් පිළිපදිනු ලැබේ දැයි සොයා බැලීම.

- නාස්තිය, නිෂ්කාර්ය ධාරිතාව සහ ප්‍රමාණය ඉක්මවා කෙරෙන වියදම් වැලැක්වීමට මෙන්ම අනාවරණය කර ගැනීමට තෝරා ගනු ලබන අභ්‍යන්තර පාලන ක්‍රමයේ සාර්ථකත්වය සොයා බැලීම.

- අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල ගිණුම් පටිපාටිය හා කිසියම් මුදල් වැය වීමකට තුඩුදෙන මෙහෙයුම් පරීක්ෂා කිරීම සහ අමාත්‍යාංශය හා එයට අයත් ආයතනවල දේපල හා වත්කම් ආරක්ෂාකාරී ලෙස අර පිරිමැස්මෙන් යුතුව විධිමත් ලෙස පරිහරණය කරන්නේ දැයි සොයා බැලීම.

- අවශ්‍ය අවස්ථාවලදී විශේෂ විමර්ශන පැවැත්වීම.

- අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු හා ආයතනවල ප්‍රගතිය සමාලෝචනය සඳහා විගණන හා කළමණාකරන කමිටු රැස්වීම ත්‍රෛමාසිකව පැවැත්වීම.

1.5.6. මූල්‍ය අංශය

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ;

- අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම .
- අමාත්‍යාංශයේ වැටුප් හා අනෙකුත් ගෙවීම් සිදු කිරීම.
- අමාත්‍යාංශයේ අවසාන ගිණුම් සකස් කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය ද ඇතුළුව අමාත්‍යාංශයේ වත්කම් කළමනාකරණය.
- අදාළ අධිකාරිත්ව වෙත වියදම් වාර්තාකිරීම හා සටහන් කිරීම.
- අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා මූල්‍ය තොරතුරු සැපයීම

1.5.7. ප්‍රාදේශීය සංවර්ධන අංශය

ප්‍රාදේශීය කර්මාන්ත ප්‍රවර්ධනය ඇතුළුව ප්‍රාදේශීය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා සුදුසු ආර්ථික හා සමාජ සංස්කෘතික වැඩසටහන් හා ජාතික ආර්ථික වර්ධන ඉලක්ක කර ගත් විශේෂ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය සංවර්ධන අංශය මගින් සිදුකර ඇත. මෙම අංශයට පසුකාලීනව ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් හා දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පැවරී ඇත.

1.6. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන

ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාව

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

අ). ව්‍යාපෘතියේ නම	ලෝක ආහාර වැඩසටහන
ආ). දායක නියෝජිතායනය	එක්සත් ජාතීන්ගේ ලෝක ආහාර වැඩසටහන
ඇ). ව්‍යාපෘතියේ ඇස්තාමින්තුගත වියදම	ඇමරිකානු ඩොලර් 46,830,793.00
ඇ). ව්‍යාපෘති කාල සීමාව	2018 – 2022

02 පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 සැලසුම් අංශය

සැලසුම් අංශය මගින් 2019 වර්ෂය තුල පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කිරීමට සමත් විය.

විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය (DCB) වැඩසටහන - 2019

ප්‍රජාවගේ සමාජ-ආර්ථික ජීවන තත්වය නංවාලීමේ අරමුණ ඇතිව එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වෙත වාර්ෂිකව රුපියල් මිලියන 10 ක් ප්‍රතිපාදන විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන (DCB) යටතේ වෙන් කරනු ලබයි. ඒ අනුව, 2019 වර්ෂයේ විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන සඳහා රුපියල් මිලියන 2,250ක් වෙන් කරන ලද අතර දිවයිනේ සියළුම දිස්ත්‍රික්ක සඳහා අයත් රුපියල් මිලියන 2,195.54 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 21,263ක් අනුමත කර ඇති අතර එම ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරිණි. 2019 වර්ෂයේ විමධ්‍යගත ප්‍රාග්ධන අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරණ ලද ව්‍යාපෘති අතුරින් 2019.12.31දින වන විට රුපියල් මිලියන 2,141.67 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 20,612 සම්පූර්ණ කර ඇත. ඒ අනුව, 96.94% ක භෞතික ප්‍රගතියක් හා 97.55% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	අනුමත කරන ලද මුළු ව්‍යපෘති සංඛ්‍යාව	නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	සම්පූර්ණ කරන ලද ව්‍යපෘති සංඛ්‍යාව	සම්පූර්ණ කරන ලද ව්‍යපෘති වල මුළු වටිනාකම (රු.)
1	අම්පාර	1,100	93,380,000.00	1,090	89,023,000.00
2	අනුරාධපුරය	1,205	93,508,450.00	1,142	83,210,482.18
3	බදුල්ල	862	93,800,000.00	765	77,345,070.92
4	මඩකලපුව	459	50,960,000.00	457	50,056,679.37
5	කොළඹ	1,226	204,719,980.60	1,214	188,769,571.38
6	ගාල්ල	1,151	105,730,000.00	1,109	96,493,331.94
7	ගම්පහ	886	197,085,000.90	847	284,791,000.90
8	හම්බන්තොට	691	71,250,000.00	688	68,661,201.57
9	යාපනය	695	69,299,000.00	695	69,240,291.03
10	කළුතර	607	124,800,000.00	607	120,979,482.82
11	මහනුවර	1,802	140,236,500.00	1,739	124,189,297.75
12	කෑගල්ල	753	93,350,000.00	705	97,865,330.05
13	කිලිනොච්චි	101	11,356,000.00	101	11,247,653.98
14	කුරුණෑගල	2,273	165,630,000.00	2,204	152,820,333.42
15	මන්නාරම	235	23,185,000.00	235	23,185,000.00
16	මාතලේ	892	52,190,000.00	892	52,190,000.00
17	මාතර	1,595	94,200,000.00	1,526	79,459,955.83
18	මොණරාගල	647	57,378,890.00	643	52,140,000.00
19	මුලතිව්	257	26,215,000.00	257	25,830,732.19
20	නුවරඑළිය	527	83,600,000.00	455	65,324,604.18
21	පොළොන්නරුව	639	53,385,000.00	624	51,720,344.72
22	පුත්තලම	1,043	82,900,000.00	1,012	76,182,481.37
23	රත්නපුර	1,000	120,915,000.00	994	115,244,076.29
24	ත්‍රිකුණාමලය	359	56,965,000.00	357	56,377,966.33
25	වවුනියාව	258	29,503,450.65	254	29,329,713.64
එකතුව		**21,263**	**2,195,542,272.15**	**20,612**	**2,141,677,602**

ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන (RIDP) – 2019

ග්‍රාමීය ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය හා නාගරික ප්‍රදේශයන්හි පවත්නා විෂමතා අවම කර බහුල වශයෙන් සෘජු හා වක්‍ර ප්‍රතිලාභ ලබාගැනීමත් - ජනතාවගේ ජීවන තත්වයන් ඉහළ නැංවීමත් අපේක්ෂා කරන ලදී.

ඒ යටතේ, ග්‍රාමීය පාලම් හා බෝක්කු ඉදි කිරීම/ සංවර්ධනය කිරීම, මාර්ග ඉදි කිරීම/ වැඩි දියුණු කිරීම, සුළු වාරිමාර්ග සංවර්ධනය, ජලසම්පාදන ව්‍යාපෘති, ස්වාභාවික විපත්වලින් හානියට පත්වූ ව්‍යාපෘති නැවත යථා තත්ත්වයට පත් කිරීම, නිෂ්පාදනයන්ට වැඩි වටිනාකමක්, මිළක් ලබා දෙන ආර්ථික කටයුතු දියුණු කිරීමට ඉවහල් වන කඩිමණ්ඩි, සතිපොළ/ ආර්ථික මධ්‍යස්ථාන ඉදිකිරීම ,ගොඩනැගිලි ඉදිකිරීම, කෘෂිකාර්මික සංවර්ධනය හා වෙනත් ප්‍රමුඛතාවය ලබා දිය යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති හඳුනා ගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, රුපියල් මිලියන 11,717.03 කවටිනාකමින් යුතු ව්‍යාපෘති 8,222ක් අනුමත කර ඇති අතර එම ව්‍යාපෘති දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරිණි. දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වාර්තා කර ඇති පරිදි රුපියල් මිලියන 8,722.70 කවටිනාකමින් යුතු ව්‍යාපෘති 4,968ක් 2019.1231 වන දින වන විට ක්‍රියාත්මක කර ඇති අතර, ඒ අතරින් රුපියල් මිලියන 6,782.8 කවටිනාකමින් යුතු ව්‍යාපෘති 4,528 ක්සම්පූර්ණ කර ඇත. ඒ අනුව, 91.14% ක භෞතික ප්‍රගතියක් හා 77.76% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	අනුමත කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව	නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති ගණන	ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති වල වටිනාකම	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ගණන	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.)
1	අම්පාර	248	427,900,000.00	204	305,561,456.00	204	299,032,867.71
2	අනුරාධපුරය	179	188,360,555.64	93	75,728,834.13	91	127,886,896.64
3	බදුල්ල	550	440,206,660.59	206	164,724,180.72	206	159,669,771.38
4	මඩකලපුව	104	186,497,315.98	80	115,425,000.00	79	108,724,638.83
5	කොළඹ	298	377,936,755.72	296	376,936,755.72	294	344,400,004.16
6	ගාල්ල	398	313,287,122.82	151	102,823,749.49	151	102,725,460.83
7	ගම්පහ	845	1,005,103,385.13	442	676,089,567.42	401	605,563,242.64
8	හම්බන්තොට	216	383,422,399.47	133	313,248,086.90	133	292,403,742.58
9	යාපනය	114	390,908,000.00	107	375,008,000.00	107	331,580,058.97
10	කළුතර	434	284,303,595.00	237	138,329,573.69	237	132,303,561.90
11	මහනුවර	338	348,516,973.33	168	300,526,750.08	168	285,320,632.58
12	කෑගල්ල	320	413,074,985.22	249	121,800,000.00	76	105,286,793.35
13	කිලිනොච්චි	25	51,136,000.00	20	41,636,000.00	20	39,932,446.91
14	කුරුණෑගල	264	1,180,059,920.83	262	1,179,059,920.83	260	1,039,364,353.60
15	මන්නාරම	372	243,285,620.00	325	181,861,320.00	304	118,649,761.20
16	මාතලේ	232	274,000,000.00	175	213,000,000.00	175	213,000,000.00
17	මාතර	1,330	1,339,170,000.00	547	1,259,856,729.12	442	558,056,599.19
18	මොණරාගල	66	54,499,701.49	34	17,000,000.00	34	15,740,000.00
19	මුලතිව්	127	208,860,000.00	101	167,610,000.00	101	160,101,257.83

20	නුවරඑළිය	350	361,050,000.00	140	146,250,000.00	140	146,250,000.00
21	පොළොන්නරුව	104	105,159,617.58	87	91,900,290.12	87	89,815,079.23
22	පුත්තලම	425	929,340,145.78	292	683,221,031.57	288	500,254,871.59
23	රත්නපුර	616	1,068,432,931.78	390	812,609,831.02	382	680,272,331.89
24	ත්‍රිකුණාමලය	77	699,381,373.79	58	516,408,474.94	46	156,041,154.97
25	වවුනියාව	130	106,442,781.15	111	90,347,697.83	80	84,898,763.61
26	ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව	1	99,700,000.00	1	88,834,416.09	1	39,090,401.36
27	නාගරික සංවර්ධනඅමාත්‍යාංශය, ජල සම්පාදන හා නිවාස පහසුකම් සංවර්ධනය සඳහා	3	110,000,000.00	3	110,000,000.00	2	46,439,209.40
28	කාන්තා හා ළමා කටයුතු හා වියළි කලාප සංවර්ධන අමාත්‍යාංශය	56	127,000,000.00	56	56,906,000.00	19	-
එකතුව		**8,222**	**11,717,035,841.30**	**4,968**	**8,722,703,665.67**	**4,528**	**6,782,803,902.35**

ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන - 2019

සමාජය තුළ සිදුවන අධ්‍යාත්මික පරිහානිය අවම කර ආගමික නැමියාවක් සහිත ශිෂ්ඨ සම්පන්න සමාජයක් බිහිකිරීම වෙනුවෙන් ආගමික ප්‍රවේශයක් ඇතිකිරීම ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අරමුණයි.

ඒ අනුව, 2019 වසරේ ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු. මි.325 ප්‍රතිපාදන වෙන්කරන ලදී. මෙම වැඩසටහන යටතේහඳුනාගත් ආගමික මධ්‍යස්ථානයන්හි දහම් පාසල් ගොඩනැගිලි, සංඝාවාස, රථගාල්, බහුකාර්ය ගොඩනැගිලි, නේවාසිකාගාර, පිරිවෙන්, ප්‍රවේශ මාර්ග, පුස්තකාල ගොඩනැගිලි, ජල විදුලි සනීපාරක්ෂක පහසුකම් ලබාදීම, වැඩිදියුණු කිරීම හා අධ්‍යාත්මික සංවර්ධන කටයුතු සඳහා උපකරණ ලබාදීම් යනාදී ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබිය.

ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීමේ වැඩසටහන 2019 ට අදාළව 2019.12.31 දින වන විට රුපියල් මිලියන 218.82ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 418ක් අනුමත කර ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරු වෙත යොමුකර ඇත. එම ව්‍යාපෘති අතුරින් 2019.12.31 දින වන විට රුපියල් මිලියන 156.57 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 384 සම්පූර්ණ කර ඇත. ඒ අනුව, 91.86% ක භෞතික ප්‍රගතියක් හා 71.55% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	අනුමත කරන ලද මුළු ව්‍යාපෘති සංඛ්‍යාව	නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.)
1	අම්පාර	1	10,200,000.00	1	9,766,696.71
2	අනුරාධපුරය	63	35,500,000.00	57	31,529,288.22
3	බදුල්ල	1	108,340.00	1	107,267.33
4	කොළඹ	1	10,000,000.00	1	9,949,764.57
5	ගාල්ල	100	16,950,000.00	100	14,474,689.88
6	ගම්පහ	10	11,250,797.50	5	7,250,797.50
7	හම්බන්තොට	1	500,000.00	0	-
8	කළුතර	11	38,136,194.31	5	9,816,944.95
9	මහනුවර	3	20,700,000.00	3	20,694,000.00
10	කෑගල්ල	3	4,000,000.00	2	2,970,000.00
11	කුරුණෑගල	7	5,900,000.00	7	5,876,541.95
12	මාතලේ	1	500,000.00	1	495,000.00
13	මාතර	1	25,556,907.26	1	17,087,123.58
14	නුවරඑළිය	5	6,500,000.00	4	1,500,000.00
15	පොළොන්නරුව	3	4,500,000.00	3	4,491,302.03
16	පුත්තලම	201	20,875,000.00	189	19,010,677.70
17	රත්නපුර	3	7,000,000.00	1	995,912.00
18	ත්‍රිකුණාමලය	3	650,000.00	3	560,000.00
එකතුව		**418**	**218,827,239.07**	**384**	**156,576,006.42**

ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - 2019

2018.07.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, රටෙහි යටිතල පහසුකම්වල ගුණාත්මක තත්ත්වය දියුණු කරමින් ජනතාවගේ ජීවනෝපාය සංවර්ධනය සඳහා උපකාර කිරීම සහ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීම යන අරමුණු පෙරදැරිව, කඩිනම් පදනමින් සමස්ත දිවයින පුරාම ක්‍රියාත්මක කිරීම සඳහා ගම්පෙරළිය වේගවත් ග්‍රාමීය සංවර්ධන වැඩසටහන 2018 වර්ෂයේ තුන්වන කාර්තුවේ ද ආරම්භ කරන ලද අතර 2019.01.02 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම වැඩසටහන 2019 වසරේදී ද ක්‍රියාවට නංවන ලදී.

මෙම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘතීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හරහා ක්‍රියාත්මක කිරීම සඳහා 2019.10.30 දින වන විට, රු. මිලියන **48,000**ක ප්‍රතිපාදන පෙර පැවති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය අමාත්‍යාංශයට ලැබී තිබුණි. ඒ අනුව, වැව් හා අමුණු ප්‍රතිසංස්කරණය, මාර්ග අංශයේ යටිතල පහසුකම් සංවර්ධනය, කුඩා පරිමාණ පාලම් ඉදිකිරීම, පාසැල්වල සනීපාරක්ෂක පහසුකම්, ක්‍රීඩා ආශ්‍රිත යටිතල පහසුකම්සහ වෙනත් සමාජ යටිතල පහසුකම්වැඩි දියුණු කිරීම, විදුලිබලය නොමැති නිවාස සඳහා විදුලිය ලබාදීම, ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය, නිවාස සංවර්ධනය (තාවකාලික වහල ස්ථිර වහල බවට පරිවර්තනය කිරීම) යන ක්ෂේත්‍ර ආවරණය වන පරිදි, රු. මිලියන 47,282.82 කවටිනාකමින් යුත් ව්‍යාපෘතීන් 117,354ක් අනුමත කොට, අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත යොමුකරන ලදී.

දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වාර්තා කරන ලද පරිදි 2019.12.31 දින වන විට රු.මි. 43,338.30 ක වටිනාකමින් යුත් ව්‍යාපෘතීන් 105,203ක් ක්‍රියාත්මක කොට ඇති අතර රු.මි. 41,494.21 ක

වටිනාකමකින් යුතු ව්‍යාපෘතීන් 101,391 ක සම්පූර්ණයෙන් වැඩ අවසන් කොට ඇත. ඒ අනුව, 96.37% ක භෞතික ප්‍රගතියක් හා 95.74% ක මූල්‍ය ප්‍රගතියක් අත්කර ගෙන ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	අනුමත කරන ලද මුළු ව්‍යපෘති සංඛ්‍යාව	නිදහස් කරන ලද මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති ගණන	ක්‍රියාත්මක කරන ලද මුළු ව්‍යාපෘති වල වටිනාකම	සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති ගණන	සම්පූර්ණ කරන ලද වැ ව්‍යාපෘති වල මුළු වටිනාකම (රු.)
1	අම්පාර	5,707	1,723,600,000.00	5,874	1,719,760,000.00	5,874	1,653,516,107.93
2	අනුරාධපුරය	6,845	2,081,500,000.00	4,827	1,835,495,677.50	4,519	1,691,788,140.36
3	බදුල්ල	4,978	2,682,810,000.00	3,696	2,178,115,953.04	3,696	2,132,432,619.45
4	මඩකලපුව	1,774	1,155,450,000.00	1,762	1,153,149,000.00	1,762	1,141,122,078.87
5	කොළඹ	9,594	3,873,590,000.00	7,291	3,304,035,121.33	7,271	2,891,013,527.26
6	ගාල්ල	6,734	2,530,260,000.00	5,309	2,356,212,602.00	5,279	2,230,419,391.11
7	ගම්පහ	11,984	3,533,400,000.00	10,580	2,868,088,130.00	9,127	2,658,748,747.65
8	හම්බන්තොට	2,424	1,200,000,000.00	2,263	1,160,963,078.50	2,263	1,141,629,903.96
9	යාපනය	4,815	2,711,250,000.00	5,220	2,674,910,000.00	5,220	2,628,408,726.89
10	කළුතර	4,902	2,518,650,000.00	4,500	2,413,888,607.00	4,500	2,312,390,109.06
11	මහනුවර	11,160	3,550,480,000.00	9,790	3,199,086,285.26	9,790	3,170,869,939.62
12	කෑගල්ල	6,324	2,582,730,000.00	6,289	2,388,137,915.47	5,641	2,268,610,037.11
13	කිලිනොච්චි	379	299,950,000.00	378	299,900,000.00	372	293,167,491.49
14	කුරුණෑගල	7,568	4,098,390,000.00	6,784	3,767,325,750.00	6,782	3,680,437,747.11
15	මන්නාරම	1,144	564,310,000.00	1,115	557,630,000.00	1,065	525,972,748.25
16	මාතලේ	2,421	1,185,250,000.00	2,833	1,186,760,000.00	2,041	1,112,461,563.16
17	මාතර	3,311	1,757,650,000.00	2,610	1,313,894,264.47	2,588	1,308,168,480.36
18	මොණරාගල	1,188	897,700,000.00	1,141	897,700,000.00	1,006	843,140,000.00
19	මුලතිව්	901	456,590,000.00	850	451,890,000.00	848	449,515,000.00
20	නුවරඑළිය	2,797	1,648,110,000.00	2,348	1,539,170,000.00	2,348	1,514,946,874.45
21	පොළොන්නරුව	7,236	891,190,000.00	8,017	849,516,612.55	8,017	823,869,649.83
22	පුත්තලම	4,049	1,481,260,000.00	3,551	1,468,217,861.72	3,551	1,356,751,772.82
23	රත්නපුර	6,103	2,188,900,000.00	5,115	2,028,767,215.73	4,780	1,943,937,852.86
24	ත්‍රිකුණාමලය	2,174	1,261,550,000.00	2,230	1,320,841,182.84	2,230	1,320,841,182.84
25	වවුනියාව	842	408,250,000.00	830	404,850,000.00	821	400,053,914.64
එකතුව		**117,354**	**47,282,820,000.00**	**105,203**	**43,338,305,257.41**	**101,391**	**41,494,213,607.08**

"සපිරි ගමක්" - ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන

"රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ග්‍රාමීය සංවර්ධනය තුලින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රට සංවර්ධනය කිරීමට අරමුණු කර ඇති අතර ජනතා කේන්ද්‍රීය ආර්ථිකයක් බිහිකිරීම තුලින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂිතය. එමගින්, හුදකළා වූ ගම, නගරය හා සම්බන්ධ කිරීමටත් ප්‍රතිග්‍රාමකරණය හරහා ගම ඉහළට ව්‍යාප්ත කිරීම තුලින් මුළු රටම තනි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමෙන් පහසුකම් සපිරි ජීවන මධ්‍යස්ථානයක් බවට "ගම"පත්කිරීම රජයේ අපේක්ෂාවයි.

උක්ත අභිප්‍රායන් ලඟාකරගැනීම උදෙසා ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය යටතේ "සපිරි ගමක්"

ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කෙරින. මේ යටතේ දිවයිනේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ 14,021ම ආවරණය වන පරිදි එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයකට රුපියල් මිලියන 02 බැගින් ප්‍රතිපාදන ලබාදේ.

ග්‍රාමීය පහසුකම් සංවර්ධනය කිරීම තුළින් රැකියා හා ජීවනෝපාය අවස්ථාවන් වර්ධනය කිරීමත්, ඒ තුළින් ග්‍රාමීය ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය නංවාලීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ. තරුණ තරුණියන් සහ කාන්තාවන් අතර ස්වයං රැකියා ජනනය කිරීමට උපකාරී වන ව්‍යාපෘති මෙන්ම අඩු ආදායම් ලාභී ජනතාවගේ ආදායම් මාර්ග වැඩිදියුණු කිරීමට ඉවහල් වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරේ.

ග්‍රාමීය මාර්ග සංවර්ධනය, කෘෂිකර්මාන්තයට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය මට්ටමින් ආර්ථිකය සංවර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සංවර්ධනය, ග්‍රාමීය සෞඛ්‍ය සංවර්ධනය සහ නවීකරණයට අවශ්‍ය පහසුකම් සැපයීම, පාසල් සඳහා විදුලිය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ඇති කිරිම මගින් අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරිම සහ ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට සෘජුවම දායක වන ප්‍රමුඛතාව දිය යුතු වෙනත් භෞතික යටිතල පහසුකම් නංවාලීමේ ව්‍යාපෘති යන ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ක්‍රියාත්මක කිරීමට අනුමත කරන ලද ව්‍යාපෘති සාරාංශය පහතින් දැක්වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ මූලික කටයුතු 2019 වර්ෂයේ ආරම්භ කලද ක්‍රියාත්මක කිරිම 2020 වසරේ දී සිදුකිරීමට නියමිතය.

සංවර්ධන අංශ	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	වෙන්කර ඇති ප්‍රතිපාදනය රු.
ග්‍රාමීය මාර්ග, පඩිපෙළ, බෝක්කු, කුඩා පාලම්, පැති කාණු ඇතුළු ගමනා ගමන පහසුකම් සංවර්ධනය	35,240	25,645.34
කෘෂි නිෂ්පාදනයන්ට අවශ්‍ය ගබඩා පහසුකම්	130	125.52
සති පොළවල්, කඩමණ්ඩි ඇතුළු ග්‍රාමීය මට්ටමේ ආර්ථික මධ්‍යස්ථාන සංවර්ධනය	95	102.43
කුඩා පරිමාණයේ වාව්, ඇළ මාර්ග, අමුණු, දිය පොකුණු, කෘෂි ළිං, ආදිය ඉදි කිරීම/ පිළිසකර කිරීම ඇතුළු වාරි මාර්ග සංවර්ධනය	708	544.76
ප්‍රජා පානීය ජල සැපයුම් සංවර්ධනය	513	431.40
ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන සංවර්ධනය හා පහසුකම් සැපයීම	259	222.45
පාසල් සඳහා විදුලිය, ජලය හා සනීපාරක්ෂක පහසුකම් ඇති කිරිම / සංවර්ධනය කිරිම	437	311.82
වන සතුන්ගෙන් ජනාවාසවලට එල්ලවන උවදුරු දුරු කිරීම හො අවම කිරීම සඳහා වන ව්‍යාපෘති	25	23.93
ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට දායක වන වෙනත් ව්‍යාපෘතින්	455	514.15
එකතුව	37,862	27,921.80

අමාත්‍ය මණ්ඩල සංදේශ

ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව	**104**

අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සඳහා ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ සංඛ්‍යාව	**44**

2.2 ආර්ථික කටයුතු අංශය

අමාත්‍යාංශයේ ආර්ථික කටයුතු අංශය විසින් 2019 වර්ෂය තුල පහත දැක්වෙන ප්‍රධාන ක්‍රියාකාරකම් සිදු කිරීමට සමත් විය. එම ක්‍රියාකාරකම්වල සාරාංශය පහත පරිදි වේ.

ස්වශක්ති ණය යෝජනා ක්‍රමය

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ග්‍රාමීය මට්ටමින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා විශේෂයෙන්ම තරුණ ප්‍රජාව සහ කාන්තාවන් දිරිමත් කිරීමට ණය පහසුකම් සලසයි.සමස්ත ණය ප්‍රමාණය රු. 200,000ක උපරිමයකට යටත්ව 5.5%ක සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ණය පහසුකම ලබා දෙන අතර ව්‍යාපාරයේ මූලික වියදම් පියවා ගැනීමට රු. 50,000ක නැවත අයකර නොගන්නා මූල්‍ය ප්‍රදානයක්ද මෙම ණය මුදල සමඟ ලබා දෙනු ලැබේ.මේ අතර, රු. 250,000ක උපරිමයකට යටත්ව එකම සහනදායී පොලී අනුපාතිකයක් යටතේ දැනට පවත්වාගෙනු යන ලබන ව්‍යාපාර සංවර්ධනය සඳහා ද ව්‍යාප්ත කරනු ඇත.

ණය පහසුකම ලබා දීමේදී ග්‍රාමීයව පවතින සුවිශේෂී සම්පත් උපයෝගී කර ගනිමින් ව්‍යාපාර ආරම්භ කිරීම, තොරතුරු තාක්ෂණයේ නියැලීම හෝ පරිසරහිතකාමීනිෂ්පාදනනිෂ්පාදනයකිරීමසඳහා නව අදහස් ඇති විශේෂ කුසලතා සහිත සහ විශේෂ අවශ්‍යතා සහිත තරුණ තරුණියන්, උපාධිධාරීන් හට ප්‍රමුඛතාව හිමිවේ. මේසම්බන්ධයෙන්, 2016 සහ 2017 කාලයතුළණයපහසුකම්ලබා දීමසඳහාරුපියල් මිලියන 4000ක මුදලක් වෙන් කරනලදී. 2019 වර්ෂය තුළදී ලබාදී ඇති ණය සහයෝජනාක්‍රමය යටතේ භාවිතා කරන ලද මුදල් ප්‍රමාණය පහත දැක්වේ.

දෙන ලද ණය සංඛ්‍යාව	ප්‍රමාණය රු.මිලියන
172	54.70

"අත්වැල" ආපදාවලින් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ)

බැංකු පද්ධතියෙන් හා රක්ෂණ යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන ස්වයං රැකියා සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයින්ට උපකාර කිරීම මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණ වේ. ඒ අනුව, ආපදාවලින් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ) හරහා ක්ෂුද්‍ර පරිමාණ සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් රැසක් ප්‍රතිලාභ ලබා ඇත.මෙම වැඩසටහනේ පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ නිතර සිදුවන ආපදාවන්හි ආර්ථික හා

සමාජීය බලපෑම අවම කිරීම සහ ආපදාවන්ගෙන් පීඩාවට පත් ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් සැපයීමයි.

හිමිකම් ඉල්ලීම් සපුරාලීම සඳහා 2017 අයවැය ප්‍රතිපාදන අනුව රුපියල් මිලියන 2000 ක මුදලක් වෙන් කරන ලද අතර, ප්‍රාග්ධන අයකර ගැනීමේ අරමුදල මගින් සෑම ආර්ථික කටයුත්තක් සඳහාම රුපියල් 500,000ක උපරිම සීමාවකට යටත්ව අවුරුදු 20ක් වන තෙක් පුනරාවර්තනය කරනු ඇත.

2019 වර්ෂයේ ප්‍රගතියෙහි සාරාංශය පහත පරිදි වේ.

වර්ෂය	දෙන ලද ණය සංඛ්‍යාව	වෙන්කිරීම් (රු. මිලියන)
2017-2018	3770	1600.00
2019	226	87.78

<u>රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති</u>

රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ව්‍යාපෘති සම්බන්ධයෙන් රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය පිළිබඳ ජාතික ඒජන්සිය, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සහ වෙනත් අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීම සිදු කරන ලදී.“ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත්ප්‍රාග්ධන වියදම් ලිහිල් කිරීම සඳහාත් රාජ්‍ය අංශයට අවශ්‍ය ගොඩනැගිලි සඳහා රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයේ පදනම මත පෞද්ගලික ආයෝජන ලබා ගැනීම” පිළිබඳ එම්එන්පීඊඒ 07/2018 චක්‍රලේඛය නිකුත් කරන ලදී.

<u>ඉරණවිල ජාත්‍යන්තර ගුවන්විදුලි කාර්යාංශය</u>

අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසින් නිකුත් කරන ලද ගෘහ භාණ්ඩ හා උපකරණ රජයේ ආයතනවලට භාරදීම හා ඒ ආශ්‍රිත කටයුතු මෙම අංශය මගින් අධීක්ෂණය කරන ලදී.

2.3 සංවර්ධන හා ව්‍යාපෘති අංශය

සංවර්ධන හා ව්‍යාපෘති අංශය විසින් පහත සඳහන් සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති මෙහෙයවීම හා සම්බන්ධීකරණය කරනු ලැබේ.

1. ලෝක ආහාර වැඩසටහන (WFP)
2. USAID අරමුදල් ව්‍යාපෘතිය
3. යුරෝපා සංගම් අරමුදල් සහිත ව්‍යාපෘති
4. “ජනාධිපතිට කියන්න” වැඩසටහන

ලෝක ආහාර වැඩසටහන (WFP)

ශ්‍රී ලංකාව තුළ තිරසාර සංවර්ධන ඉලක්ක(SDG) ළඟා කරගැනීමට ක්‍රියාත්මක ව්‍යාපෘති හා සමගාමීව ලෝක ආහාර වැඩසටහන මගින් දායකත්වය සපයනු ලබන ව්‍යාපෘතින්ද ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ලෝක ආහාර වැඩසටහනෙහි ශ්‍රී ලංකාව සඳහා වන උපායමාර්ගික සැලැස්ම (Country Strategic Plan) ක්‍රියාත්මක කිරීම සඳහා රජය සහ ලෝක ආහාර වැඩසටහන අතර 2018 සිට 2022 දක්වා වසර 5 ක කාලයක් සඳහා වැඩසටහන සැලසුම් කර ඇත. උක්ත උපායමාර්ගික සැලැස්ම යටතේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රතිඵල හතරක් ඇත.

i. අර්බුදයට මැදිවූ ජනතාවට ආහාර සඳහා ප්‍රවේශ වීම
ii. වර්ෂය පුරාම ආහාර සුරක්ෂිතභාවය රහිත ප්‍රදේශ වල පාසල් යන දරුවන්ට ආහාර සඳහා ප්‍රවේශ වීම.
iii. 2025 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වසර 05ට අඩු දරුවන්ගේ යෞවනියන්ගේ හා ගර්භණී මාතාවන්ගේ පෝෂණය ඉහල නැංවීම.
iv. ශ්‍රී ලාංකිකයින් හට වසර පුරාම ස්වභාවික විපත් වලින් සිදු වන කම්පන හා ආතති වලදී හොඳින් මුහුණ දීමට හැකියාව ලබාදීම.

ඉහත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරන ලදී:

සහල් සබලකරණ කිරීමේ ව්‍යාපෘතිය (Rice Fortification Project)

මෙම නියමු ව්‍යාපෘතිය සිසුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා වන ජාතික පාසල් ආහාර වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ තඹුත්තේගම අධ්‍යාපන කලාපයේ ක්‍රියාත්මක කරන ලදී. තෝරාගත් පාසල් 64 ක යකඩ පෝෂණීය අගයන් එකතුකළ සහල් මෙට්‍රික් ටොන් 50,000 ක් බෙදා හැර ඇති අතර සිසුන් 17,604 කට එමගින් ප්‍රතිලාභ ලබා දී තිබේ. යකඩ පෝෂණීය ඌනතාවයන් අවම කිරීම සහ සිසුන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම මෙහි අරමුණයි. තවද, නියමු ව්‍යාපෘතියේ ප්‍රතිඵල මත පදනම්ව, 2020 දී ව්‍යාපෘතිය අනුරාධපුර දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක කරනු ඇත. 2019වර්ෂයේ මෙහිමුළු වියදම රු. මිලියන 27කි.

ගෙවතු පාදක කරගත් පාසල් ආහාර වැඩසටහන

පාසල් අවට වගා කළහැකි පලතුරු හා එළවළු ප්‍රවර්ධනය කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. තණමල්විල, විල්ගමුව සහ නෙදුන්කර්නි යන අධ්‍යාපන කලාපවල නියමු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. වැඩසටහන මෙහෙයවීම සහ මග පෙන්වීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් තාක්ෂණික උපදේශක කණ්ඩායම, (Technical Advisory Group) පිහිටුවා ඇත. ව්‍යාපෘති ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් තෝරාගත් පාසල්වල සනීපාරක්ෂක පිළිවෙත් ශක්තිමත් කිරීම සඳහා පාසල් භෝජනාගාරයක් ඉදිකිරීම සහ අඛණ්ඩව ආහාර සැපයීම සඳහා ආහාර සපයන්නන්ට සහාය වීම සහ පාසල් ආහාර සඳහා දේශීය පෝෂක ආහාර සැපයීම සහතික කිරීම වෙනුවෙන් සැලසුම් කර ඇත.

දේශගුණික විපර්යාස හේතුවෙන් අවදානමට ලක්වන ජනතාවට උපකාර කිරීම සඳහා පහත සඳහන් ව්‍යාපෘති, මොනරාගල, මඩකලපුව, මන්නාරම, මුලතිව් සහ මාතලේ යන දිස්ත්‍රික්ක 5තුල ක්‍රියාත්මක කරන ලදී.

සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය කිරීම

2019 -2021 වසර 3 ක කාලය තුළ අලුත්වැඩියා කිරීමට කුඩා වැව් 80 ක් තෝරා ගනු ඇත. 2019 දී රුපියල් මිලියන 40 ක් වැය කරමින් වැව් 15 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී. වැව් පුනරුත්ථාපනය සඳහා සහභාගී වන ප්‍රජාවට මාස 6 ක කාල සීමාවක් සඳහා දිනකට රුපියල් 1100බැගින් මසකට දින 20 ක් සඳහා (ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම වෙනුවෙන්) ගෙවන ලදී.

ග්‍රාමීය ප්‍රජාවන්ට සහාය වීම

නියඟ කාලවලදී කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය එක්රැස් කර ගැනීම සඳහා කෘෂි ළිං අලුතෙන් ඉදිකිරීම හෝ ප්‍රතිසංස්කරණය මෙහි අරමුණවේ. මෙම ව්‍යාපෘතිය යටතේ එක් පවුලකට රුපියල් 153,000 ක් ප්‍රදානය කෙරේ.සඳහා පවුල් 212 ක් සඳහා කෘෂි ළිං 212 ක් සහ ඊට අමතරව, අවශ්‍ය පුහුණුවීම්, බීජ හා රෝපණ ද්‍රව්‍ය සහ වෙළඳපල සම්බන්ධතා ප්‍රතිලාභීන්ට ලබා දෙනු ලැබේ. රුපියල් මිලියන 39 ක් ආයෝජනය කර ඇත.

ආහාර සුරක්ෂිතතා තක්සේරු සමීක්ෂණය (Food security Assessment Survey)

ශ්‍රී ලංකාව 2017 ගෝලීය සාගිනි දර්ශකයේ (Global Hunger Index)“දැඩි” (severe)කාණ්ඩය තුලට ද ඇතුලත් ව ඇත. එමෙන්ම කෘෂ භාවය (wasting) බහුලව ඇති අතර වයස අවුරුදු පහට අඩු දරුවන්ට එය බලපා ඇති බැවින්, ආහාර අනාරක්ෂිතතාවයතුළ අවදානමට ලක්විය හැකි අවධානම් ස්ථාන හඳුනා ගැනීම සහ ඊට මූලික හේතු අවබෝධ කර ගැනීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ජාතික මට්ටමින් ආහාර සුරක්ෂිත භාවය සහ අවදානම තක්සේරු කිරීම ආරම්භ කර ඇත.

මූල්‍ය කේත	වෙන් කිරීම 2019 - රුපියල් මිලියන	වියදම රු. මිලියනයක	ප්‍රගතිය%
13	260.00	91.48	35.18
16	239.60	239.16	99.82
17	129.16	20.24	15.67
Total	**628.76**	**350.88**	**55.81**

USAID අරමුදල් සහිත ව්‍යාපෘති

USAID අරමුදල් සපයන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා රජය (GOSL) සහ ඇමරිකා එක්සත් ජනපදය අතර අත්සන් කරන ලද ආධාර ගිවිසුමට අනුව ය. ඒ අනුව, USAID වැඩසටහන යටතේ ආනයනික භාණ්ඩ සඳහා වන බදු සහ වැට් බද්දෙන් නිදහස් කිරීමට ශ්‍රී ලංකා රජය බැඳී සිටී. නව ආර්ථික වර්ධන වැඩසටහන වන VEGA BIZ + සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය ශක්තිමත් කිරීම සහ වගවීමේ ව්‍යාපෘතිය (SDGAP) යන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක වේ. ව්යාපෘති පිළිබඳ විස්තර පහත පරිදි වේ.

නව ආර්ථික වර්ධන වැඩසටහන: VEGA BIZ +

දේශීය හවුල්කරුවන් සමඟ රාජ්‍ය - පෞද්ගලික සන්ධානයන්ට සහාය වන අතර ව්‍යාපාරවල කළමණාකරණ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා තාක්ෂණික සහාය, පුහුණුව සහ ප්‍රදාන සපයයි තවද , උද්‍යානළංකරණය, කිරිගව පාලනය, ජලජීවී වගාව, සැපයුම් සේවා, ඇඟලුම් සහ ඉදිකිරීම් කර්මාන්ත ඇතුළු ඉලක්කගත කර්මාන්තවල නිෂ්පාදන ක්‍රියාවලිය ඉහල නැංවීමට දායකත්වය සපයයි. උප ව්‍යාපෘති USAID විසින් කෙලින්ම ක්‍රියාත්මක කරනු ලැබේ. 2019 දී රුපියල් මිලියන 4.7 ක් ශ්‍රී ලංකා රජය ප්‍රතිපූරණය කරන ලදී.

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීමේ ව්‍යාපෘතිය ශක්තිමත් කිරීම (SDGAP)

අංක 383-0126 ආධාර ගිවිසුමේ දක්වා ඇති විධිවිධාන යටතේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සහ වගවීම ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (SDGAP) ප්‍රධාන ආයතන කිහිපයක් හා රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වන්නේ මහජන වගවීමේ ක්‍රම සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය වැඩි කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට සහාය වීමයි. රුපියල් මිලියන 6.4 ක් 2019 දී ප්‍රතිපූරණය කරන ලදී.

යුරෝපීය සංගමය (EU) අරමුදල් සපයන ව්‍යාපෘති

මධ්‍යම හා ඌව පළාතේ සහ ඔවුන්ගේ පළාත් පාලන ආයතනවල සහාය ඇතිව විවිධ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන පහක් මගින් ක්‍රියාත්මක කරනු ලබන යුරෝපා සංගම් අරමුදල් සපයන ව්‍යාපෘති මෙම අංශය සම්බන්ධීකරණය කරයි. මෙම වැඩසටහන පහත සඳහන් පරිදි ව්‍යාපෘති පහකින් සමන්විත වේ:

i.. ව්‍යවසාය ව්‍යාපෘතිය

ii. වතු හා අවට ප්‍රජාවන් වෙනුවෙන් වැඩිදියුණු කළ සෞඛ්‍ය හා පෝෂණය සඳහා ජලය, සනීපාරක්ෂාව, සනීපාරක්ෂාව (WASH) පිළිබඳ ව්‍යාපෘතිය.

iii. ශ්‍රී ලංකාවේ මධ්‍යම හා ඌව පළාත්වල ඒකාබද්ධ ආර්ථික සංවර්ධනය

iv. පාරිසරික හා පෝෂණ සංවර්ධනය සඳහා ප්‍රජාවන්ට සහාය වීම (ACCEND)

v. ඌව සහ මධ්‍යම පළාත්වල ස්ත්‍රී පුරුෂ සමාජභාවය ඇතුළත් සමාජ ආර්ථික සංවර්ධනය වැඩි දියුණු කිරීම

එක ජාතික ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පවත්වන ලදී.අමාත්‍යාංශය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ගැටළු සාකච්ඡා කිරීම හා විසඳීම සඳහා පළාත් මෙහෙයුම් කමිටුවලට සහභාගී වේ.

ජනාධිපතිට කියන්න වැඩසටහන

වැඩිදියුණු කළ නව දත්ත පදනමක් ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ජනාධිපතිවරයාට කියන්න වැඩසටහන සඳහා හඳුන්වා දී ඇත. විවිධාකාර ඉල්ලීම් හා දුක්ගැනවිලි විද්‍යුත් දත්ත ගබඩාව හරහා මහජනයා විසින් මෙම අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ. ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීම සඳහා ඉල්ලීම් හා දුක්ගැනවිලි අමාත්‍යාංශයේ විෂය පථයට අයත් ආයතන වෙත යොමු කෙරේ.

2019 වර්ෂය තුළ ජනාධිපතිට පවසන්න වැඩසටහනේ ප්‍රගතිය

ලැබුණු මුළු දුක්ගැනවිලි	382
විසඳා හෝ විසඳීමට ගත් ක්‍රියාමාර්ග	369
ප්‍රගතිය%	96.6

2.4 පරිපාලන අංශය

පුහුණු ව්‍යාපෘති සහයකයින් 7500 ක් වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගැනීම

ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා විසින් මෙම අමාත්‍යාංශය සඳහා පුහුණු ව්‍යාපෘති සහයකවරුන් 7500 ක් බඳවා ගැනීමට ඉදිරිපත් කරන ලද 2019.03.09 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමතිය ලැබුණි. ඒ අනුව, රජය මගින් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලට සහයවීම සඳහා රැකියා විරහිත, අ.පො.ස.(සා.පෙළ) සමත්වූවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වා, එයින් තෝරාගත් අයදුම්කරුවන් 7500 ක් සඳහා වසරක රු.15000/-ක දීමනාවක් යටතේ වන පරිදි පත්වීම් ලබාදෙන ලදි. නමුත්, 2020.01.03 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව මෙම පුහුණු ව්‍යාපෘති සහායක පත්වීම් අවලංගු කිරීමට තීරණය කරන ලදි.

රැකියා විරහිත උපාධිධාරීන් 20000/ක් අභ්‍යාසලාභී උපාධිධාරි පුහුණු ලෙස බඳවා ගැනීම

රැකියා විරහිත උපාධිධාරීන් **20000/**ක් අභ්‍යාසලාභී උපාධිධාරි පුහුණු ලෙස බඳවා ගැනීම සඳහා **2018.05.30** දිනැතිව අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත්ක කළ අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල තීරණය ලැබුණි. ඒ අනුව, මසකට රු.**20000/-**ක දීමනාවක් යටතේ වසරක පුහුණු කාලයක් සඳහා පහත සඳහන් ලෙස ඔවුන් බඳවා ගන්නා ලදි.

පළමු අදියර	**5000**
දෙවන අදියර	**15000**

පළමු අදියර යටතේ බඳවා ගන්නා ලද උපාධිධාරීන් **3200** ක් සඳහා වසරක පුහුණු කාලය අවසන්ව ස්ථිර පත්වීම් ලබාදීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මගින් කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි **16800** වන උපාධිධාරීන් හට ස්ථිර පත්වීම් ලබාදීම සඳහා පෞද්ගලික ලිපිගොනුවලට අදාළවන කටයුතු මේ වන විට සිදුකරමින් පවතී.

2.5 ප්‍රාදේශීය සංවර්ධන අංශය

ප්‍රාදේශීය ආර්ථික හා සමාජීය සංවර්ධනයට සෘජුවම පාදක වන ඵලදායිතාවයෙන් ඉහල ව්‍යාපෘති හදුනාගෙන ඒ සඳහා ප්‍රතිපාදන සලසන පහත දැක්වෙන සංවර්ධන වැඩසටහන් හතර 2019 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලදි.

1. ප්‍රාදේශීය යටිතල පහසුකම් වැඩසටහන
2. සමාජ සංස්කෘතික සංවර්ධන වැඩසටහන
3. ප්‍රාදේශීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන
4. නිවාස සංවර්ධන වැඩසටහන

ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ශය සඳහා රුපියල් මිලියන 262ක් වෙන් කර ඇත. එම මුදලින් රුපියල් මිලියන 71.96ක් 2018 වර්ෂයේ අවිච්ඡේද හා අතැති බිල් සඳහා වෙන් කර ඇති අතර 2019 වර්ෂයේ නව ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 190.04ක් වෙන් කර ඇත.

2019 වර්ෂයේ නව ව්‍යාපෘති සඳහා වෙන් කර තිබූ මුදලින් මිලියන 188.60ක් නිදහස් කර යවා ඇත. ඊට අදාල ව්‍යාපෘති සංඛ්‍යාව 46කි. මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධන ව්‍යාපෘති ප්‍රාදේශීය පාලම්, බෝක්කු ප්‍රතිසංස්කරණය හා ඉදි කිරීමේ ව්‍යාපෘති, වැව් අමුණු, ඇලවේලි ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘති, පොදු ක්‍රීඩාංගන සංවර්ධන ව්‍යාපෘති, ප්‍රජා ශාලා සංවර්ධන ව්‍යාපෘති හා ග්‍රාමීය පාසල් සංවර්ධන ව්‍යාපෘති ඇතුලත් වේ.

සමාජ සංස්කෘතික සංවර්ධන වැඩසටහන් යටතේ මිලියන 25ක් වෙන් කර තිබූ අතර එයින් මිලියන 17.65ක් නිදහස් කර ඇත. අදාල ව්‍යාපෘති සංඛ්‍යාව 48ක් වේ. සමාජ සංස්කෘතික සංවර්ධන වැඩසටහන් යටතේ ආගමික ස්ථාන සංවර්ධන ව්‍යාපෘති, ප්‍රජා සංවර්ධන සමිති සඳහා පහසුකම් සැපයීමේ ව්‍යාපෘති යන ව්‍යාපෘති ඇතුලත් වේ.

ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 50ක් වෙන් කර තිබූ අතර රුපියල් මිලියන 12.01 ක් නිදහස් කර ඇත. එහි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 314කි. මෙම වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවනෝපාය ඉහල නැංවීම හා විරැකියාව අවම කිරීම, සුළු හා කුඩා පරිමාණ ව්‍යවසාය කර්මාන්ත පිහිටුවීම සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘති ඇතුලත් වේ.

ප්‍රාදේශීය නිවාස සංවර්ධන වැඩසටහන යටතේ මිලියන 38ක් වෙන් කර ඇති අතර මිලියන 10.20ක් නිදහස් කර ඇත. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 617කි. ඒ යටතේ අඩු ආදායම්ලාභී හා අඩක් නිමකල නිවාස සංවර්ධනය සඳහා ද්‍රව්‍යාධාර ලබා දීමේ ව්‍යාපෘති ඇතුලත් වේ.

2.6 අභියෝග

ඉහත දක්වා ඇති පරිදි, ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය නගාසිටුවීමේ අරමුණ ඇතිව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශය විසින් 2019 වර්ෂයේ දී විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. එසේ වුවත්, වර්ෂය තුල ඇතිවූ විවිධ අභියෝග එම වැඩසටහන්වල 100% ප්‍රගතියක් අත්කර ගැනීමට නොහැකි විය. වර්ෂය ආර්මිභයේ සිටම අවස්ථා ගණනනාවකදී අමාත්‍යාංශයේ හා අංශයේ විෂයපථයන් වෙනස්වීම හේතුකොට ගෙන වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ප්‍රමාදවිය. 2019.04.21 දින එල්ල වූ පාස්කු ඉරිදා ප්‍රහාරය හේතුවෙන් ඇති වූ ගැටළුකාරීතත්වය ද සංවර්ධන ක්‍රියාකාරකම් හා ප්‍රගතිය කෙරෙහි නව අභියෝගයක් විය.

පසුගිය වර්ෂය අවසාන භාගයේ ඇති වූ අක්මුදල් හිඟය ව්‍යාපෘති අවසන් සැලකිය යුතු අභියෝගයක් වූ අතර, දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වාර්ථා කර ඇති පරිදි වර්ෂ අවසානයේ ආසන්න වශයෙන් රුපියල් මිලියන 11,895 පමණ අතැති බිල්පත් දිස්ත්‍රික්ක මට්ටමින් පැවතිනි. 2019 ජනාධිපතිවරණ සමයේදී සංවර්ධන වැඩකටයුතු වෙතද බලපෑමක් ඇති වූ අතර, 2019 නොවැම්බර් මාසයේ දී නව රජය බලයට පත්වීමත් සමගම වැඩසටහන් සමාලෝචනය කරන තෙක් භෞතිකව වැඩ ආර්මිභ නොකළ ව්‍යාපෘති අත්හිටුවීමට මහාභාණ්ඩාගාරය මගින් උපදෙස් ලබා දුන් අතර ඒ හේතුවෙන් සමහරක් සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක නොවිය.

2.7 ඉදිරි දැක්ම

"රට හදන - සෞභාගයේ දැක්ම" රජයේ වැඩපිළිවෙල ජනතාවගේ ආදායම් මට්ටම වැඩිකිරීමේ අභිලාෂයෙන් යුතුව අමාත්‍යාංශය විසින් ප්‍රතිපත්තිමය පියවර සැලසුම් කරනු ලැබේ. තවද, රටේ ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීම හා නවීකරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව ව්‍යාපෘති හා වැඩසටහන් සකස් කර ඇත. සංවර්ධනයේදී ප්‍රාදේශීය සමබරතාවය තහවුරු කර ගැනීමට හා රාජ්‍ය පුද්ගලික හවුල්කාරිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය විසින් පියවර ගනු ලැබේ.

රජයේ ප්‍රතිපත්තිමය නියමයන්ගේ මඟපෙන්වීම යටතේ සමාජ සුභසාධනය, දිගු කාලීන සෞභාග්‍යය සහ තිරසර සංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා මෙම පියවර ඉලක්ක ගතකර ඇත. මෙම රාජ්‍ය අමාතයාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන "සපිරි ගමක්" ජනතා සහභාගීත්ව ග්‍රාමීය සංවර්ධන වැඩසටහන රජය මගින් ඉදිරි වර්ෂයේ ක්‍රියාවට නන්වන ප්‍රමුඛ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනයි.

....

එස්.එච්.ඒ.එන්.ඩී. අභයරත්න

රාජ්‍ය ලේකම්

ගණන්දීමේ නිළධාරී

පරිච්ඡේදය 3 - 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූලික කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයසඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	තත්‍ය 2019	2018	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවාමත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මතබදු	3	-	-	ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හාවෙනත්	4	55,024,445	888,953,232	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		**55,024,445**	**888,953,232**	
-	**ආදායම් නොවන ලැබීම්**			-	
-	භාණ්ඩාගාර අග්‍රිම		3,406,615,000	2,684,698,309	ඒසීඒ-3
-	තැන්පතු		73,837,479	31,351,055	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		57,332,210	26,228,645	ඒසීඒ-5/5(ඒ)/5(බී)
-	වෙනත් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවනලැබීම් (ආ)**		**3,537,784,689**	2,742,278,009	
-	**මුළු ආදායම් ලැබීම් සහආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**3,592,809,134**	**3,631,231,241**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
4,731,610,000	වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	3,059,905,225	576,660,161	ඒසීඒ-2(ii)
759,940,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	737,164,014	229,398,479	ඒසීඒ-2(ii)
8,144,622,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	7,365,997,772	1,922,284,327	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	ඒසීඒ-2(ii)

690,000	වෙනත් පුනරාවර්තනවියදම්	9	438,915	295,021	
13,636,862,000	**මුළු පුනරාවර්තනවියදම් (ඈ)**		**11,163,505,926**	**2,728,637,988**	
	මූලධන වියදම්				
	මූලධන වත්කම්				
252,650,000	පුනරුත්ථාපනය හාවැඩිදියුණු කිරීම්	10	165,010,260	10,432,508	
1,744,600,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,731,515,082	1,041,510,412	
6,869,500,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	4,201,498,964	2,322,778,252	**ඒසීඒ-2(ii)**
100,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	24,894,028	200,000,000	
130,600,000	හැකියා වර්ධනය	14	95,803,726	2,280,861	
71,865,000,000	වෙනත් මූලධන වියදම්	15	50,571,707,287	15,750,623,356	
80,962,350,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**56,790,429,347**	**19,327,625,389**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**230,198,826**	58,730,494	
	තැන්පතු ගෙවීම්		74,890,144	32,404,187	**ඒසීඒ-4**
	අත්තිකාරම් ගෙවීම්		155,308,682	26,326,308	**ඒසීඒ-5/5(ඒ)/5(බී)**
	මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)		68,184,134,099	22,114,993,871	
-	**2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයඌ = (ඇ-උ)**		**(64,591,324,965)**	**(18,483,762,630)**	

** 2018 වර්ෂයේ තත්‍යඅගයන්ගෙන් නිරූපණය වන්නේ 2018 වර්ෂයේ වැය ශීර්ෂ අංක 104 යටතේ පැවති අගයන්ය.

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2,019 රු.	2018 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	3,013,702,695	924,091,651
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	167,276,209	69,299,737
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**3,180,978,904**	**993,391,388**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		67,457,990	913,037,261
දේපළ පිරියත හා උපකරණ සංචිතය		3,013,702,695	-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	99,315,026	80,354,127
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	503,193	-
මුළු වගකීම්		**3,180,978,904**	**993,391,388**

පිටු අංක......02..සිට .....61 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ..62.... සිට ...92.... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම : S.H.A.N.D අබේරත්න	නම :
තනතුර :	තනතුර : ලේකම්	
දිනය : 28/2/2020	දිනය :	දිනය : 27.02.2020

S. H. A. N. D. Abeyrathne
Secretary
State Ministry of Economy and Policy Development
"Miloda", 1st Floor,
Bristol Street,
Colombo 01.

ඩබ්. එම්. ඩබ්. ආර්. දිසානායක
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

එස්. ආර්. ආටිගල
මහා භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ ලේ
මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ
මහලේකම් කාර්යාලය
කොළඹ 01

** 2018 වර්ෂයේ තත්‍ය අගයන්ගෙන් නිරූපණය වන්නේ 2018 වර්ෂයේ වැය ශීර්ෂ අංක 104 යටතේ පැවති අගයන්ය.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර්31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහප්‍රකාශය

	සතය 2019 රු.	2018 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	888,953,232
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	55,024,445	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	241,519,844	-
අග්‍රිම ලැබීම්	3,406,615,000	2,684,698,309
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**3,703,159,289**	**3,573,651,541**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,299,444,270	2,511,809,287
සහනාධාරසහ මාරුකිරීම්	237,507,378	18,993,477
වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	12,121,695	-
භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,549,073,343**	**2,530,802,764**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,154,085,946**	**1,042,848,777**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	44,204,899	21,957,465
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**44,204,899**	**21,957,465**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්	2,140,490,764	1,039,892,354
අත්තිකාරම් ගෙවීම්	55,773,321	24,839,123
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**2,196,264,085**	**1,064,731,477**

ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(2,152,059,186)**	**(1,042,774,012)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	**2,026,760**	**74,765**
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	82,678,337	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**82,678,337**	**-**
<u>**අඩුකළා : මුදල් වැය කිරීම්**</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	84,705,097	74,765
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**84,705,097**	**74,765**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**(2,026,760)**	**(74,765)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

** 2018 වර්ෂයේ තත්‍යඅගයන්ගෙන් නිරූපණය වන්නේ 2018 වර්ෂයේ වැය ශීර්ෂ අංක 104 යටතේ පැවති අගයන්ය.

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2019 ජනවාරි **01** සිට දෙසැම්බර් **31** දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.

අනාර්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූලාය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් **31** දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමෙන් කාර්ය සාධනය

(රු.),000

ආදායම් කේතය	ආදායම් කේත යේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමෙන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ %
		අදාල නොවේ			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනුලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල්ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
පුනරාවර්තන	13,636,862,000	13,749,576,000	11,163,505,926	81
ප්‍රාග්ධන	80,962,350,000	88,727,781,000	56,790,429,347	64

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනුඅංකය	ප්‍රතිපාදනලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසානප්‍රතිපාදන		
1	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හාදිස්ත්‍රික් ලේකම් කාර්යාල	අභ්‍යාසලාභී උපාධිදාරීන්ගේ දීමනාව	3,738,500,000	3,666,484,415	2,054,265,764	56
2	කාන්තා හා ළමා කටයුතු සහ වියළිකලාප සංවර්ධන අමා.	මෙහෙයුම් කල්බදු වාරික	5,900,000	5,900,000	5,369,925	91
3	රජයේ මුද්‍රණදෙපා.	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීයඅවශ්‍යතා	6,600,000	7,700,000	43,700	1
4	ප්‍රවෘත්ති දෙපා.	වැටුප් හා වේතන	135,400,000	135,950,000	300,663	-
5	දිස්ත්‍රික්ලේකම්-රත්නපුර				29,033	
6	අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හාදිස්ත්‍රික් ලේකම් කාර්යාල	ව්‍යාපෘති හා වෙනත්	65,468,700,000	65,464,184,175	40,719,046,909	62

* සටහන- මෙහි දැක්වෙන්නේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථිකකටයුතු අංශයට අදාළ වැය ශීර්ෂයන් යටතේ දරන ලද වියදම් වේ.

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම්කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩසමීක්ෂණ	31.12.2019 දිනට මූල්‍ය තත්වවාර්තාව	ඉදිරියේදී ගිණුම්කරණයට		ප්‍රගතිය %
9151	ගොඩනැගිලි	725,005,000	725,005,000	-		100
9152	යන්ත්‍රෝපකරණ	1,711,197,395	1,711,197,395	-		100
9153	ඉඩම්	577,500,300	577,500,300	-		100
එකතුව		3,013,702,695	3,013,702,695	-		100

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

2019 වර්ෂයට අදාලව විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 මගින් දක්වා ඇත.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙසත් නිමැවුම		
	100%-90%	**75%-89%**	**50%-74%**
ප්‍රාදේශිය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර අවසන් කිරීම	**96.25%**		
කම්පන සහ ආතතියට ඔරොත්තු දීම සඳහා ජීවනෝපාය මාර්ග ශක්තිමත් කරනු ලැබූ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සංඛ්‍යාව		**82.5%**	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

<table>
<tr><th rowspan="2">ඉලක්කය / අරමුණ</th><th rowspan="2">ඉලක්ක</th><th rowspan="2">ජයග්‍රහණ දර්ශක</th><th colspan="3">මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය</th></tr>
<tr><th>0%-49%</th><th>50%-74%</th><th>75%- 100%</th></tr>
<tr><td>1. දිළිඳුබව තුරන් කිරීම</td><td rowspan="2">සමාජ ආර්ථික යටිතලපහසුකම් වැඩිදියුණු කිරීමට අදාළව සංවර්ධන ව්‍යාපෘති 131,852 ක් ක්‍රියාත්මක කර ඇත.</td><td rowspan="2">සංවර්ධන ව්‍යාපෘති 126,915 ක වැඩ අවසන්කර ඇත.</td><td rowspan="2"></td><td rowspan="2"></td><td rowspan="2">96.25%</td></tr>
<tr><td>9. කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්</td></tr>
<tr><td rowspan="3">2- කුසගින්න තුරන් කිරීම</td><td>2,500</td><td>අවදානමට ලක්විය හැකි පුද්ගලයින්ගෙන් සෘජුවම ප්‍රතිලාභ ලද ප්‍රමාණය</td><td></td><td></td><td>75%</td></tr>
<tr><td>346</td><td>පුනරුත්ථාපනය කරන ලද යටිතල පහසුකම් ව්‍යාපෘති ගණන (කෘෂි ළිං / කුඩා පරිමාණ වැව්)</td><td></td><td>55%</td><td></td></tr>
<tr><td>383, 771</td><td>ප්‍රතිලාභ ලැබූ සිසුන් සංඛ්‍යාව</td><td></td><td></td><td>90%</td></tr>
</table>

සටහන : 2019 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු ලේඛනයේ දක්වා ඇති පරිදි තිරසර සංවර්ධන අරමුණු දක්වා ඇත. කෙසේ වෙතත් අමාත්‍යාංශයට විෂයපථයට අදාළ තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක අදාළ ආයතන මගින් මෙතෙක් හඳුන්වා දී නොමැත.

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

පහතින් දක්වා ඇති විවිධ ස්වභාවික, සාමාජීය හා පරිපාලනමය ගැටළු සංවර්ධන ව්‍යාපෘති ප්‍රමාද වීම හෝ අවළංගුවීමට හේතුවී ඇත.

අ). වර්ෂාව හා ගංවතුර, නායයාම් හා නියඟය වැනි කාළගුණික සාධක
ආ). තාක්ෂණික නිළධාරීන් වැනි බිම්මට්ටමේ නිළධාරී හිඟය
ඇ). අමුද්‍රව්‍ය හිඟය
ඈ). ආයතන ගණනාවකින් එකඟතාවය ලබාගැනීමට සිදුවීම
ඉ). සුදුසුකම් ඇති කොන්ත්‍රාත් කරුවන්ගේ හිඟය

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	34	14	20
තෘතීයික	6	3	3
ද්විතියික	109	86	23
ප්‍රාථමික	112	82	30

6.2 **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

අංක 2156/3 දරණ 2019.12.30 දිනැති රජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශයක් බවට පත් වුවද ඒ සඳහා සේවක සංඛ්‍යාව අනුමත කර නොමැති අතර,මෙම අමාත්‍යාංශය කැබිනට් අමාතයාංශය යටතේ පවතින කාල සීමාව තුල අනුමත සේවක සංඛ්‍යාව අනුව අමතයාංශයේ කටයුතු සිදු කරන බැවින් මානව සම්පත් හිඟය අමාත්‍යාංශයේ කාර්ය සාධනයට බලපෑමක් සිදු නොවීය.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	කාර්ය මණ්ඩල ප්‍රවණතාවය	වැඩසටහනේ කාල පරාසය	මුළු ආයෝජනය		වැඩසටහනේ ස්වාභාවය (විදේශීය / දේශීය)	ලබාගත් දැනුම ආයතනයේ කටයුතු වලට ඉවහල් වුවාද
			දේශීය	විදේශීය		
International Management development program on global strategic leadership for growth and sustainable development	01	25 නොවැම්බර් – 20 දෙසැම්බර් 2019		ඉන්දීය රජය විසින් වියදම් දරා ඇත	විදේශීය	ඔව්
Global convening in transformative food assistance for zero hunger	01	04 – 06 නොවැම්බර් 2019		ලෝක ආහාර වැඩසටහන විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්

Seminar in infrastructure development and planning for Sri Lanka	04	10th – 30thනොවැම්බර් 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
2019 Seminar on Building smart cities under belt and road initiate	01	10th – 30thනොවැම්බර් 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
Seminar on Chinas development experience and its reform and opening/ up policies for Sri Lanka	01	28thසැප්තැම්බර් – 1stඔක්තෝබර් 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
Global Conference on festering partnerships	01	8th – 14thසැප්තැම්බර් 2019		GICHD විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
2019 Seminar for developing counties on coordinated development of E comers retail industry	01	12thඅගෝස්තු – 03 සැප්තැම්බර් 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
International Visitors Leadership Program	01	01st – 06thඅගෝස්තු - 10thසැප්තැම්බර් 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
AVPN Conference 2019 Strategic Policy Dialog 2019/ Asia Policy forum	01	25th – 28thජුනි 2019		ESCAP විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
Cross Country Leaning Workshop gender repose budgeting	01	11th – 30thසැප්තැම්බර් 2019		UN විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
06TH Asia pacific forum in Sustainable development	01	27th – 29thමාර්තු 2019		Rs. 47,500	විදේශීය	ඔව්
Seminar on infrastructure Planning construction for Sri Lanka	03	05thසැප්තැම්බර් – 25th 2019		චීන රජය විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
Study tower Sri Lanka SSTC pilot project under CSP of	01	21th – 29thදෙසැම්බර්		ලෝක ආහාර වැඩසටහන	විදේශීය	ඔව්

GOSL/ WFP		2019		විසින් වියදම දරා ඇත		
Global Child Nutrition forum	01	2nd – 06th දෙසැම්බර් 2019		ලෝක ආහාර වැඩසටහන විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්
4th revive conference of the mind free world 2019	01	25th – 29th නොවැම්බර් 2019		Downer (Helo trust) විසින් වියදම දරා ඇත	විදේශීය	ඔව්

07 පරිච්ඡේදය–අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේක267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය	අනුකූල වේ		

	නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.			
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	2කට පමණක් මාසයක් තුල පිලිතුරු එවා නැත	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ	අනුකූල වේ		

	තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛඅංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	වෙනත් ආයතනවලට අයත් ව තිබූ වාහන බැවින් අපහරණය කිරීමට පෙර මෙම අමාත්‍යාංශය නමින් පවරා ගැනීමේ කටයුතු කිරීමට සිදුවීම	පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර ගැනීම.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර	අනුකූල වේ	-	-

	පවත්වාගෙන යාම			
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			

12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	ශුන්‍ය අගයකි		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		

15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අංක -2156/3දරණ දිනැති රජයේ 2019.12.30 අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශයක් බවට පත්වීම මත වාර්ථා ඉදිරිපත් කල නොහැකි වීම.	මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අදාල කාර්යභාර වාර්ථාව ඉදිරියේ දී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	අංක -2156/3දරණ දිනැති 2019.12.30 රජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මෙම අමාත්‍යාංශය රාජ්‍ය අමාත්‍යාංශයක් බවට පත්වීම මත කාර්යභාරය .සංශෝධනය වීම	මෙම රාජ්‍ය අමාත්‍යාංශයට අදාල සංශෝධිත පුරවැසි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ප්‍රදර්ශනය කිරීම.
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශය විටින් විට ප්‍රතිව්‍යුහගත වීම මත නිවැරදි තොරතුරු රැස්කර ගැනීමට නොහැකි වීම.	මානව සම්පත් සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කර ඒ පිළිබඳ අධීක්ෂණය සිදු කිරීම.
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම			
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම			

20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීආර්ඊ/ඊ/එමඑන්පීර්ජ්/02/19/98 | ඔබේ අංකය / உமது இல. / Your No. } | දිනය / திகதி / Date } 2019 ජුනි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත

පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) ඉකුත් වර්ෂයේ ශිර්ෂය - 104, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, අමාත්‍යාංශ විෂයයන්ගේ සිදුවූ වෙනස්වීම් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ තරුණ කටයුතු අමාත්‍යාංශය වශයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇතත්, මූල්‍ය ප්‍රකාශනයේ ඉකුත් වර්ෂයේ සංඛ්‍යාවන් වශයෙන් ඉදිරිපත් කර තිබුණේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයට අදාල සංඛ්‍යාවන් පමණක් බැවින් මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ප්‍රකාශ කළ නොහැක.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.4 (ඇ)	සේවක අර්ථසාධක අරමුදලට පරිගණක ලබාගැනීමට 2016 වර්ෂයේදී ලබාදුන් රු.10,000,000ක් කාර්යාලීය හා උපකරණ ආරම්භක ශේෂය තුල ඇතුළත්ව තිබුණි.	අමාත්‍යාංශයේ නොවන වත්කම් නිවැරදිව හඳුනාගෙන ඒ අනුව වත්කම් ගිණුම් නිවැරදි කළ යුතුවේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 මූලධන වියදම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අංශයට අදාලව උපකරණ සැපයීම, ඉදිකිරීම් හා ධාරිතා සංවර්ධනය වෙනුවෙන් 2019 වර්ෂයේ කොළඹ වෘත්තීය පුහුණු

මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට අදාලව ගෙවන ලද සෘජු විදේශීය ගෙවීම් රු.205,670,588 ක් ගෙවීම් සිදුකර මහ බැංකු වාර්තාවෙහි 2019 දෙසැම්බර් මාසය සඳහා සටහන් වී ඇතත් ජාතික ණය සීමාව ඉක්මවිය නොහැකි බැවින් 2019 වසර යටතේ එය ගිණුම්ගත නොකිරීමට මහා භාණ්ඩාගාරය තීරණය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල වැය විෂයන් 03 ක එකතුව රු.205,670,588 ක් අඩුවෙන් දක්වා තිබුණි. විස්තර පහත දැක්වේ.

වැය විෂයය	වියදම
	රු.
104-2-15-20-2103-12	42,868,601
104-2-15-20-2104-12	84,964,990
104-2-15-20-2401-12	77,836,997
එකතුව	205,670,588

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නායකත්ව පුහුණු ජාතික මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.15,771,902 ක් වුවද එය 2019 ජනවාරි 01 දිනට රු.879,900 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් රු.14,892,002 ක් අඩුවෙන් දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශනවල ආරම්භක ශේෂය අඩුවෙන් දැක්වීමට හේතු මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) පුනරුත්ථාපන හා නැවත පදිංචිකිරීම් අංශයේ සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් රු.1,131,225 ක් වුවද මූල්‍ය නොවන වත්කම්හි එය රු.1,155,708 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.24,483 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) තරුණ කටයුතු අංශයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.21,478,925 ක් වුවද එය 2019 ජනවාරි 01 දිනට රු.31,574,380 ක් ලෙස දැක්වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්වල ආරම්භක ශේෂයේ රු.10,095,455 ක වෙනසක් විය. සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත අවස්ථා අරමුදලින් මිලදීගැනීම් රු.5,906,000ක් ආරම්භක ශේෂයට ගැලපීමෙන් පසුව තවදුරටත් රු.4,189,455ක්

වෙනසක් නිරික්ෂණය වුවද, එයට හේතු දැක්වීම් මූල්‍ය ප්‍රකාශනවල සටහනක් මගින් ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයට අදාලව සමාලෝචිත වර්ෂයේ මගී වාහන හැර අනෙකුත් මූල්‍ය නොවන වත්කම් මිලදීගැනීම් රු.3,108,035 ක් වුවද එය රු.2,140,765 ක් ලෙස දැක්වීම හේතුවෙන් වත්කම් මිලදීගැනීම් රු.967,270ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ). නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අංශය විසින් 2019 වර්ෂය තුල අපහරණය කරන ලද රු.2,856,029 ක වත්කම් මූල්‍ය නොවන වත්කම් ගිණුම් වටිනාකමින් ඉවත්කර නොතිබුණද, එයට හේතු දැක්වීම් සටහනක් මගින් ඉදිරිපත්කර නොතිබුණි.

(ඊ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි ඇතුළත් සංඛ්‍යාමය අගයන් 2019 වසර සඳහා වූ භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ආදායම් වියදම් හා ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ එකඟ විය යුතු වුවද, මූ.රෙ. 208 අනුව ශීර්ෂ අංක 104 මගින් ශීර්ෂ අංක 149 යටතේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට ප්‍රතිපාදන පවරා දී ඇති අතර සිගාස් පද්ධතිය ශීර්ෂ අංක 149 හි උප කාර්යාලයක් ලෙස ක්‍රියාත්මක වී තිබුණි. ඒ හේතුවෙන් 2019 වර්ෂයට අදාලව මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් සිගාස් පද්ධතියට ඇතුලත් කර නොතිබීමෙන් ගිණුමෙහි දැක්වෙන රු.1,772,648,629 ක ස්ථාවර වත්කම් ශේෂය භාණ්ඩාගාර ශේෂ සමඟ එකඟ කල නොහැකි විය.

1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අංශයට අදාලව රු.832,431,983ක්වූ මගී වාහන හා ප්‍රාදේශීය සංවර්ධන අංශයට අදාලව රු.41,893,773 ක මූල්‍ය නොවන වත්කම් මූල්‍ය ප්‍රකාශනයේ සඳහන්ව තිබුණද, එම වත්කම්වල භෞතික පැවැත්ම තහවුරු කෙරෙන බවට 2019 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ සිදුකර එම සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සංවර්ධන අංශයේ මූල්‍ය නොවන වත්කම්වලින් භෞතික වෙනස්වීම වශයෙන් රු.50,399,525 ක් සමාලෝචිත වර්ෂයේ වත්කම්වලින් ඉවත්කිරිම පිළිබඳ

උපලේඛනයක් ඉදිරිපත් කර ඇතත් ඒ සඳහා වූ අනුමැතිය, එම වත්කම් පැවරුම හා භාරගැනීමට අදාල ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයට අදාල වූ ශුද්ධ වෙන්කිරීම රු.102,477,357,000 ක් වූ අතර ඉන් රු.67,953,935,273 ක් වර්ෂය තුල වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය සියයට 33.69 ක් වූ අතර සියයට 36 ක් වූ මූලධන ප්‍රතිපාදනයේ ඉතිරිය ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

(ආ) අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලස්වාගෙන තිබූ එකතුව රු.මිලියන 576 ක මූලධන වැය විෂයයන් 20ක ප්‍රතිපාදන හා එකතුව රු.මිලියන 11.8 ක පුනරාවර්තන වැය විෂයයන් 5ක ප්‍රතිපාදන ප්‍රයෝජනයට නොගෙන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ඇ) නිශ්චිත කාර්යන් ඉටුකර ගැනිම සඳහා වර්ෂය තුල ලබාගත් පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරිම් අදාල කාර්යයන් සඳහා යොදවා ගෙන නොතිබුණු අවස්ථා පහත පරිදි විය.

වැය විෂයය	ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය	පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම	ශුද්ධ ප්‍රතිපාදනය	වියදම	ඉතිරිය/ ඉක්මවීම	ප්‍රතිශතය
	රු.	රු.	රු.	රු.	රු.	%
104-2-14-40-2202/11	100,000,000	50,000,000	150,000,000	0	150,000,000	100
104-2-14-46-2509/11	0	260,000,000	260,000,000	0	260,000,000	100

(ඈ) මූලධන වැය විෂයයන් 84කට අදාලව වෙන් කළ ප්‍රතිපාදනවලින් සියයට 21 සිට සියයට 100ක් දක්වා පරාසයක් තුළ එකතුව රු.මිලියන28,905 ක්ද, පුනරාවර්තන වැය විෂයයන් 71 කට අදාලව සියයට 21 සිට සියයට 100 දක්වා පරාසයක් තුළ එකතුව රු.මිලියන2,263ක්ද වශයෙන් මුළු එකතුව රු.මිලියන31,168 ක් උපයෝජනය කර නොතිබුණි. එම ඉතිරිය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 39ක් විය.

(ඉ) වැය විෂයයන් 35 ක් සඳහා වෙන් කර ගන්නා ලද රු.589,275,000 ක්වූ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මු.රෙ.66 මගින් වර්ෂය තුල රු.309,163,605 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි. එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 17 සිට සියයට 100 දක්වා පරාසයක විය.

(ඊ) ඒ ඒ වැය විෂයයන්ගෙන් අපේක්ෂිත අරමුණු අධ්‍යයනය කිරීමකින් තොරව හා අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳ නිසි සැලසුමකින් තොරව ඇස්තමේන්තු පිළියෙල කිරීම හේතුවෙන් වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අංශයට අදාලව පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයට අදාල මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.9,456,896,000 ක්වූ අතර ඉන් රු.8,020,232,082 ක් වර්ෂය තුල වැයකර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයේ ඉතිරිය සියයට 15 ක්වූ අතර සියයට 27 ක්වූ මූලධන ප්‍රතිපාදනයේ ඉතිරිය ඊට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ii) වැය විෂයයන් 09 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු. 231,750,000 ක ප්‍රතිපාදනවලින් එක් එක් වැය විෂයය යටතේ සියයට 70 කට වැඩි ප්‍රතිපාදන අදාල අරමුණු කරා යෙදවීමෙන් තොරව ඉතිරි කර තිබුණි.

වැය විෂය	ප්‍රතිපාදනය	ඉතිරිය
	(රු.)	%
104-01-01-0-2002	100,000	100
104-01-13-01-1003-02	500,000	100
104-01-13-0-1703	150,000	92
104-02-15-31-2002	6,000,000	100
104-02-15-20-2401	110,000,000	77
104-02-15-43-2509-0	25,000,000	100
104-02-15-44-2509	25,000,000	100
104-02-15-44-2509	5,000,000	100

(iii) වැය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට 100 ක් සහ තවත් වැය විෂයයන් 05 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයන් සියයට 60 සිට සියයට 98 දක්වා වූ ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි. විස්තර පහත දැක්වේ.

වැය විෂය	වාර්ෂික අයවැය වෙන්කිරීම	මු.රෙ.66 යටතේ මාරු කිරීම	මු.රෙ. 66 මාරු කිරීම් ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් සියයට
	(රු.)	(රු.)	%
104-01-01-0-1203	50,000	46,000	92
104-01-01-0-1303	250,000	225,000	90
104-01-01-0-1401	1,200,000	1,090,000	91
104-01-13-0-1303	2,500,000	1,500,000	60
104-02-15-31-2104-01	100,000,000	98,000,000	98
104-02-15-20-2401	5,000,000	5,000,000	100
104-02-15-20-2509	35,000,000	35,000,000	100

(iv) එකතුව රු.457,250,000 ක්වූ වැය විෂයන් 05 ක මුල් වියදම් ඇස්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුල සංශෝධනයට ලක්කර තිබුණු අතර එය මුල් ඇස්තමේන්තුවෙන් සියයට 107 සිට සියයට 200 ක් දක්වා වූ පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

වැය විෂය	මූලික වියදම් ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	වෙනස සියයට	හේතුව
	(රු.)	(රු.)	(%.)	
104-01-01-0-1101	750,000	2,252,000	200	අමාත්‍ය කාර්යමණ්ඩලයේ අනුමත ගමන් වියදම් සඳහා

				ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
104-01-13-0-2001	1,500,000	3,100,000	107	පාලන අංශයේ හා ගිනි ආරක්ෂණ පද්ධතියේ අත්‍යාවශ්‍ය නඩත්තු හා අළුත්වැඩියාවන් සිදු කිරීමට වෙන්කල ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
104-02-15-31-2104-02	235,000,000	529,000,000	125	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ CGTTI, කිලිනොච්චි ශිෂ්‍ය නේවාසිකාගාරය ඉදිකිරීම් සැලසුම් 2019 වර්ෂයේදී අනුමත කිරීම නිසා ඉදිකිරීම් කටයුතු සඳහා තවදුරටත් ප්‍රතිපාදන අවශ්‍ය වීම.
104-02-15-38-2506-12	180,000,000	430,000,000	139	කටුනායක ඉංජිනේරු තාක්ෂණ ආයතනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන ඉක්මවා බැරකම් සඳහා පහත සඳහන් පරිදි එළඹ තිබුණි.

වැය විෂය	ශුද්ධ ප්‍රතිපාදනය	උපයෝජනය	ඉතිරිය	එළඹ තිබුණු බැරකම්	ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා එළඹ තිබුණු බැරකම්
	රු.	රු.	රු.	රු.	රු.
104-1-2-0-1002-11	10,033,475.00	10,026,055.63	7,419.37	512,028.00	504,608.63
104-1-2-0-1402-11	17,800,000.00	17,741,465.84	58,534.16	967,607.00	909,072.84

104-1-10-0-1403-11	9,000,000.00	8,497,045.90	502,954.10	775,347.00	272,392.90
104-2-6-17-2509-17	12,966,235.68	12,966,092.15	143.53	4,260,000.00	4,259,856.47
104-1-9-0-1409-11	8,963,000.00	8,887,797.33	75,202.67	467,216.00	392,013.33
104-1-9-0-1404-11	36,550,000.00	33,750,000.00	2,800,000.00	5,600,000.00	2,800,000.00

(ආ) රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එහි ඇතුලත් සංඛ්‍යාමය අගයන් 2019 වසර සඳහා වූ භාණ්ඩාගාර අවසන් ගිණුම් ප්‍රකාශනයේ සඳහන් ආදායම් වියදම් හා ප්‍රධාන ලෙජර් ශේෂ සමඟ එකඟ විය යුතුය. එමෙන්ම 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/ 2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු සිගාස් පද්ධතියට ඇතුලත් කලයුතු වුවත්, බැදීම් හා බැරකම් පිළිබඳව අදාල දත්ත ඇතුලත් කිරීමට නොහැකි වීම හේතුවෙන් 2019 වර්ෂයට අදාලව බැදීම් හා බැරකම් පිළිබඳව භාණ්ඩාගාර ප්‍රකාශයේ වාර්තා වී නොතිබුණි. ඒ හේතුවෙන් වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අංශයට අදාලව 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/ 2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 ඡේදය ප්‍රකාරව සටහන් අංක III යටතේ වන බැදීම් හා බැරකම් ප්‍රකාශය භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ සැසඳීම් කල නොහැකි විය.

2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්. එම්. ඩී. එස්. සුදීෂ් රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට